# ව්‍යාපාර අධ්‍යයනය

## 8.1 ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි



## නිපුණතා මට්ටම 8.1



### ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි.

**ඉගෙනුම් ඵල:-**

- අවදානම යන්න පැහැදිලි කරයි
- ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු විය හැකි අවදානම් ලැයිස්තුවක් පිළියෙළ කරයි
- රක්ෂණය යන්න හඳුන්වයි
- රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නොහැකි අවදානම් ලෙස අවදානම් වර්ග කරයි
- රක්ෂණය කළ හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි
- රක්ෂණය කළ නොහැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි
- ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි
- රක්ෂණ ගිවිසුම යන්න පැහැදිලි කරයි
- රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි
- රක්ෂණ ගිවිසුමට ඇතුළත් වන කරුණු ලැයිස්තුගත කරයි




අන්තර්ගතය :- ඒ. දයාල් පීරිස් මයා. ගුරුළුගෝමි මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අවදානම (Risk)

රක්ෂණයේ දී මුල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදුවීමට ඇති ඉඩකඩ අවදානමක් ලෙස හැඳින්වේ.

නිදසුන් :-
වයාපාරය ගිනි ගැනීම
සොර සතුරු උවදුරු
වයාපාරය පාඩු ලැබීම
වයාපාරයේ දේපල වලට සිදු විය හැකි හානි



## රක්ෂණය (Insurance)

අනාගතයේ දී ඇතිවිය හැකියැයි අපේක්ෂිත අවදානමක් වෙනුවෙන්, රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයකු හා රක්ෂකයකු අතර ඇති කර ගන්නා එකඟතාව රක්ෂණය ලෙස හැඳින්වේ.

union assurance

Sri Lanka Insurance

ARPICO Insurance

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk



## අවදානම්

### රක්ෂණය කළ හැකි අවදානම්

* ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදුවන අවදානම්
* රථවාහන අනතුරු අවදානම්
* මාර්ගස්ථ මුදල්වලට වන හානි
* ණය ගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම.

### රක්ෂණය කළ නොහැකි අවදානම්

* ව්‍යාපාරය පාඩු ලැබීම
* ස්වාභාවික හේතූන් නිසා ඇතිවන අවදානම් (ක්ෂය වීම්, යල් පැනීම, වාෂ්ප වීම )
* තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම් (විභාග අසමත් වීම , ආදරය අහිමි වීම )
* මෝස්තරය වෙනස් වීම නිසා සිදුවන අවදානම්.

## රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ

* අවදානම පුරෝකථනය කළ හැකි වීම.
* අනාගතයේ සිදුවිය හැකි අවදානම මුල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම.
* අවදානම නියත නොවිය යුතු වීම (අලාභය සිදුවිය යුත්තේ අහඹු ලෙස වීම ).
* සම්බන්ධතාවලින් තොර වීම.
  (සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නොවිය යුතුයි)
* සත්‍යාපනය කළ හැකි වීම.
  (අලාභය සිදුවීමේ හේතුව , ස්ථානය , වෙලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි වීම.)









අන්තර්ගතය :- ඒ. දයාල් පීරිස් මයා. ගුරුළුගෝමී මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව

* රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා, ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙලඹීම.
* ආබාධිත තත්ත්වයක දී හෝ මරණයක දී මූල්‍යමය ආරක්ෂාවක් ලැබීම(සේවකයන්ට).
* රක්ෂණ සමාගම් තමන් සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම.
* මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳාම දියුණු වීම.

### රක්ෂණ ගිවිසුම

රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක් , රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාව



### රක්ෂණ ඔප්පුව

කිසියම් ජීවිතයකට හෝ දේපළකට අදාළව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසුව ඊට අදාළව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකය




අන්තර්ගතය :- ඒ. දයාල් පීරිස් මයා. ගුරුළුගෝමී මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව

ප්‍රධාන පාර්ශ්ව

**පළමු පක්ෂය (රක්ෂිතයා )**

රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබා ගන්නා පුද්ගලයා

**දෙවන පක්ෂය (රක්ෂකයා)**

රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශවය හෙවත් රක්ෂණ සමාගම

**තෙවන පක්ෂය (බාහිර පක්ෂය)**

රක්ෂණ ගිවිසුමේ ක්‍රියාකාරිත්වයෙන් ඇති වන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාව යි. රක්ෂිත විෂය වස්තුව නිසා සිදු වූ හානියක දී වන්දි ලැබීමට හිමිකම් දක්වන බාහිර පුද්ගලයන් හා දේපළ

## රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග

* නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
* අර්පනය හෙවත් යෝජනාව
* ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
* නෛතික බව.නීතියට එකඟ බව
* ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇතිකර ගැනීමට ඇති හැකියාව
* ප්‍රතිෂ්ඨාවක් හෙවත් මූල්‍යමය අගයක් පැවතීම.



අන්තර්ගතය :- ඒ. දයාල් පීරිස් මයා. ගුරුළුගෝමි මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk